# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 43 දරන අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 31 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1992 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිල : ශත 60 යි. • තැපැල් ගාස්තුව : රු. 1.00

## 1992 අංක 43 දරන අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 113/90

### අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමය හා සම්බන්ධ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කරගෙන යෑමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි පිහිටුවා ගෙන තුබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ඉටු කර සහ ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1992 අංක 43 දරන අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දින සිට හා ඉන්පසු, (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනමේ දැනට සාමාජික යන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුලත් කරගනු ලබන තැනැත්තන් "අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන අතර, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධවද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. අල්-හාජ් එන්. එම්. බුහාර්දීන් පදනම සංස්ථාගත කිරීම.

**3.** පදනම පිහිටුවීම අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— පදනමේ පොදු පරමාර්ථ.

(අ) ඉස්ලාම් ධර්මය හැදෑරීම නංවාලීම ;

(ආ) ශ්‍රී ලංකාවේ ජනතාව අතරේ පවත්නා සමාජමය හා වෙනත් විෂමතාවන් දුරුකරලීම සඳහා කටයුතු කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ජනතාවගේ අධ්‍යාත්මික, ආගමික, සංස්කෘතික සමාජයීය හා ආර්ථික ශුභසාධනය නංවාලීම ;

(ඈ) ජනවාර්ගික සුහදතාවය, ජාත්‍යන්තර මිත්‍රත්වය හා අවබෝධය වර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර විනය ගරුක භාවය හා ආත්ම විශ්වාසය පිළිබඳ හැඟීම් තහවුරු කිරීමට කටයුතු කිරීම ;

(ඉ) ඉස්ලාම් ධර්මය පිළිබඳ තරඟ, දේශන, සාකච්ඡා, දර්ශන සහ ප්‍රදර්ශන සංවිධානය කිරීම, නංවාලීම සහ ඒවාට ධෛර්ය දීම සහ ඉස්ලාම් ධර්මය පිළිබඳ වාර සංග්‍රහ, සඟරා, අත්පොත්, පත්‍රිකා සහ වෙනත් ප්‍රකාශන මුද්‍රණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම ;

(ඊ) ඉස්ලාම් ධර්මය හැදෑරීම සහ ප්‍රචාරය කිරීම සඳහා පුස්තකාල හා කියවීම් ශාලා පිහිටුවීම ;

(උ) උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා තරුණයන්ට මුදල් ආධාර දීම සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ඌ) තරුණයන්ට ස්වකීය වෘත්තිය හැකියාවන් සහ දක්ෂතා වර්ධනය කර ගැනීමට හැකිවනු පිණිස වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථාන පිහිටුවා පාලනය කරගෙන යෑම සහ එවැනි මධ්‍යස්ථාන පිහිටුවා පවත්වා ගෙන යාමට ආධාර කිරීම ;

(එ) අධ්‍යාපනය නගාසිටුවීම අරභයා ක්‍රියා කරන පාසල්, මධ්‍යස්ථාන සහ වෙනත් එබඳු ආයතන පිහිටුවා ඒවා පාලනය කිරීම සහ ඒවා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ආධාර කිරීම ;

(ඒ) අධ්‍යාපන කටයුතු නගා සිටුවීමේ කාර්යයන්හි නිරත තැනැත්තන්ගේ හැකියාවන් සහ කුසලතාවන් වැඩි දියුණු කිරීම සඳහා සහ පර්යේෂණ කටයුතුවලට ආධාර කිරීම ;

(ඔ) අරාබි භාෂාව සහ සාහිත්‍ය සහ ඉස්ලාම් ධර්මය සම්බන්ධයෙන් කරනු ලබන හැදෑරීම් සහ පර්යේෂණ කටයුතු දිරි ගැන්වීම සහ වර්ධනය කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් සඳහා ශුද්ධ වූ මක්කාහ් වන්දනා ගමන් සංවිධානය කිරීම, ඒවා වැඩි දියුණු කිරීම සහ ඒ සඳහා දිරි ගැන්වීම ;

(ක) ආරෝග්‍යශාලා සහ මාතෘ නිවාස පිහිටුවීම සහ ඒවා පවත්වා ගෙන යෑම ;

(ග) ආබාධිතයන් බවට පත් වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර කිරීම ;

(ච) ශ්‍රී ලංකාවේ ජනතාවට නොමිලයේ වෛද්‍ය පහසුකම් සැලසීම සහ නොමිලයේ සෞඛ්‍ය කඳවුරු පවත්වා ගෙනයාම ;

(ජ) අනාථ නිවාස, වැඩිහිටි නිවාස සහ අසරණ නිවාස පිහිටුවා ඒවා පවත්වාගෙන යෑම ;

(ට) ස්වකීය 'නිකාහ්' උත්සවය සඳහා මුදල් අවශ්‍ය වන මුස්ලිම් කාන්තාවන්ට මුදලින් ආධාර කිරීම; සහ

(ඩ) ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් 'ජනාසා' යහ සාධක අරමුදල නමින් අරමුදලක් පවත්වාගෙන යෑම සහ එය පාලනය කිරීම.

4. පදනමේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ලබා ගැනීමේ සහ එකතු කිරීමේ ද පරිත්‍යාග සහ ආධාර මුදල් භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද පදනමේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව පදනමේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම සහ නංවා ලීම සඳහා අවශ්‍ය හෝ උචිත කවර වුවද සියලු ක්‍රියා කිරීමේ ද කළයුතු ඉටු කිරීමේ ද කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීමේ ද බලය, මේ පනතෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක අඩංගු විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය. පදනමේ සාමාන්‍ය බලතල.

5. (1) පදනමේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, පදනමේ තත් කාලයේ බලපවත්නා රීති වලට යටත්ව පදනමේ මහා සභාව විසින් එකී රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වූ මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය. පදනමේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මණ්ඩලයේ කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් මණ්ඩලයේ සභාපති, උපසභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ඇතුළු මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් පස් දෙනෙකුගෙන් සමන්විත වූ විධායක කමිටුවක් වෙත පැවරීමේ බලය මණ්ඩලයට ඇති අතර ඒ මණ්ඩලයේ මග පෙන්වීම අනුව ස්වකීය කටයුතු ඉටු කළ යුතු ය.

(3) පදනමේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය. ඔවුන්ගේ නම් මේ පනතෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තේ ය.

6. (1) පදනමට සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම සඳහා ද නිලධරයන්, අධ්‍යක්ෂ මණ්ඩලය, විධායක කමිටුව තෝරා පත්කර ගැනීම සඳහා ද පදනමේ විවිධ නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහ කිරීම සඳහා ද සාමාන්‍ය යෙන් පදනමේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා පදනමේ රීති.

වූ ද රීති, පදනමේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු ඡන්දයෙන් කලින් කල පදනම විසින් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එවැනි රීති සාදනු ලැබීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාර යෙන් ඒවා නිවැරදි කිරීම, වෙනස් කිරීම ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) පදනමේ සාමාජිකයන් පදනමේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් පදනම සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහිලා පදනමට බලය ඇති අතර, එවැනි සියලු දේපළ, ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරුකර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා පදනම විසින් දැරිය යුතු ය.

සංගමයට ගෙවනු ලැබිය යුතු සහ සංගමය විසින් ගෙවනු ලැබිය යුතු ණය.

8. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සංගමයේ පැවති සියලුම ණය සහ බැරකම් පදනම විසින් ගෙවනු ලැබිය යුතු වන අතර, එදිනට සංගමයට අය විය යුතු සියලුම ණය හෝ ගෙවිය යුතු දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා පදනමට ගෙවනු ලැබිය යුතු වන්නේ ය.

පදනමේ මුද්‍රාව.

9. පදනමේ මුද්‍රාව—

(අ) විධායක කමිටුව විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි වන්නේ ය;

(ආ) විධායක කමිටුවේ අනුමැතිය පරිදි සහ විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී මිස කිසිම සාධන පත්‍රය කට හෝ ලියවිල්ලකට නොතැබිය යුතු වන අතර එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශ යෙන් එකී සාධන පත්‍රයේ හෝ ලියවිල්ලේ තම තම අත්සන් කළ යුතු වන්නේය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන කට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් ගේ මාර්ගයෙන් හෝ, ඔවුන් යටතෙහි හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු වන්නේ ය.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

### උපලේඛනය

[5(3) වන වගන්තිය]

(i) සභාපති ... අල්-හාජ් එන්. එම්. මුහාර්දීන් මහතා.

(ii) උපසභාපති ... අල්-හාජ් එන්. එම්. අබ්දුල් හමීඩ් මහතා.

(iii) ලේකම් ... එස්. එල්. එම්. හලීන් මහතා

(iv) භාණ්ඩාගාරික ... එම්. ඉම්ටියාස් මුහාර්දීන් මහතා.

(v) විධායක කමිටු සාමාජික ... එම්. එස්. එම්. හුසේනුදීන් මහතා.

(vi) මණ්ඩලයේ සාමාජිකයන් ... එම්. යූ. එම්. ෆාරිස් මහතා.

ඒ. එච්. එම්. අස්හාර් මහතා.

ඒ. ඕ. එම්. ෆලීල් මහතා.

එම්. එල්. එම්. ජවුෆර් මහතා.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි.
(විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ
අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් එවා පසුව එළඹෙන
එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.